229

# වයඹ පළාතේ ග්‍රාමීය ප්‍රජාවට සපයා ඇති ණය පහසුකම් එහි ආර්ථික හා සාමාජික සංවර්ධනයට දක්වන ලද දායකත්වය

— එච්. එම්. ධනපාල —

ECON/R/119/98

කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යාපති (ආර්ථික විද්‍යා) පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධයකි.

1998 අගෝස්තු

# නිබන්ධ සාරාංශය

නිදහසින් පසුව ග්‍රාමීය අංශයේ ආර්ථික හා සමාජ සංවර්ධනය කෙරෙහි මූල්‍යමය අනුබලයක් ලබාදීම සඳහා බිහිවුනු ආයතනික ක්‍රියාදාමයන්ද ඒවා හා සමීප වූ ණය යෝජනා ක්‍රමයන්ද කෙතෙක් දක්නට ලැබෙන නමුදු එකී ග්‍රාමීය අංශයේ සමාජ ආර්ථික සංවර්ධනයක් ඇතිවූයේද යන්න අද ප්‍රශ්ණාර්ථයක්ව පවතී. 1971 හා 1988 යන වසරවල ශ්‍රී ලංකාවේ සිදුවූ සමාජමය අරගලයන් දෙස බලන කල්හි ග්‍රාමීය අංශවල තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් ආර්ථික හා සමාජ සංවර්ධනයන්ට සම්බන්ධ නොවීම තුලින් අසම්මත වූ කැරලිකාර පසුබිමකට හේතු සාධකවූ බව පෙනී යන කරුණකි. ඒ නිසා ග්‍රාමීය ප්‍රජාව සංවර්ධන ක්‍රියාවලියට දායක කර ගැනීම සඳහා යමකිසි ආකාරයක පෙලඹුම් සාධකයක් ලෙසින් දැකිය හැකි මූල්‍ය අනුබලයක් ලබාදෙන ණය සැපයුම් ක්‍රියාවලිය විෂය කාරක කර ගනිමින් වයඹ පලාතේ ග්‍රාමීය ප්‍රජාවට සපයා ඇති ණය පහසුකම් එහි ආර්ථික හා සාමාජික සංවර්ධනයට දක්වන ලද දායකත්වය පරීක්ෂාවට ලක්කරලීම මෙම පරීක්ෂණයේ මූලික අරමුණ වේ.

මෙහිදී මූල්‍ය පහසුකම් සඳහා දායක වන මූල්‍ය අධිකාරිය පිළිබඳ හැඳින්වීමක්ද එහි ආයතනික ක්‍රියාදාමය සහ ණය ව්‍යාපෘති පිළිබඳ පරීක්ෂාවක්ද සිදු කෙරේ. මෙම පදනම මත සිට වයඹ පලාතේ ග්‍රාමීය ප්‍රජාවට සපයා ඇති ණය පහසුකම් පිළිබඳ ඇගයීමක් කෙරෙන අතර මේ සම්බන්ධයෙන් පවත්නා ගැටළු හඳුනා ගැනීමත් ඒ අනුව ග්‍රාමීය අංශයට ඵලදායී ණය සැලැස්ම සකස් විය යුත්තේ කවර ආකාරයෙන්ද යන්නත් පරීක්ෂා කොට ඇත.

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික හා ද්විතික දත්ත දෙවර්ගයම යොදාගනු ලැබිනි. ද්විතික දත්ත මගින් ඓතිහාසික තොරතුරුත්, පූර්ව පර්යේෂන ඇගයීමත්, ආයතනික ව්‍යුහය හා ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමත් සිදුකෙරේ. ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලද්දේ වයඹ පලාතේ කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික්කයන් ඈතුලත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ නවයකින් ගම් 32 ක් හා ඉන් පවුල් 105 ක නියැදියක් සසම්භාවීව

සමීක්ෂණයට භාජනය කිරීමෙනි. මෙම ප්‍රාථමික දත්තයන් මූලික සංඛ්‍යානමය උපක්‍රම භාවිතා කරමින් විශ්ලේෂණය කරන ලදී.

අධ්‍යයනයෙන් හෙළිවූ තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ණය සැපයුම නිදහසින් පසුව රාජ්‍ය හා මූල්‍ය පිළිවෙත්වලට අනුව කාලානුරූපව වෙනස් වී ඇති අතර ඒ හා බැඳුනු ආයතනික රාමුව සතුටුදායක ලෙස ගොඩනැඟී ඇති බව පැහැදිලි විය. ලංකා බැංකුව ජනසතු කිරීමෙන් පසුව කෘෂිකාර්මික ඵලදා වර්ධන පනත හා සමගාමී අණ පණත් මඟින් බිහි කරන ලද ආයතනික පසුබිම උපකාරී කර ගනිමින් ග්‍රාමීය ණය සැපයුම වර්ධනය වී ඇති අතර, මහජන බැංකුව, සමූපකාර ග්‍රාමීය බැංකු හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු පිහිටුවීම, සංවර්ධන ණය සැපයීමේ මූලික මෙහෙයට දායක වී ඇත.

වයඹ පළාත සම්බන්ධයෙන්ද ඉහත කාරණය අදාළවේ.

ආයතනික ව්‍යුහය ප්‍රමාණවත් වුවද ග්‍රාමීය ජනතාවගේ සමාජ ආර්ථික තත්වය ඉහළ නැංවීම පිණිස අවශ්‍යය ව්‍යුහාත්මක වෙනස්කම් ප්‍රමාණාත්මකව සිදු වී නැත. ආයතනික අංශයෙන් සලකා බලන විට ග්‍රාමීය අංශයේ කෘෂිකාර්මික හා කුඩා ව්‍යාපාර වලට ණය සැපයීමේ පසුබෑමක්ද, පසු විපරම්වල අඩුපාඩුද දක්නට ලැබේ. ව්‍යුහාත්මක වශයෙන් වශයෙන් සලකා බලන විට අසංවිධිත අංශයේ ප්‍රමාණය විශාල වීමද ඒ නිසාම අලෙවිකරණ ප්‍රශ්න, මූල්‍යමය ප්‍රශ්න හා ආකල්පමය ගැටළු නිසා ආයතනික ප්‍රතිපත්ති මඟින් ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථික සාමාජීය සංවර්ධනයට ඇති වන දායකත්වය සතුටු දායක මට්ටමක නොපවතින බව පෙනේ.

ග්‍රාමීය අංශයට ඵලදායි ලෙස එනම් ඔවුන්ගේ ආර්ථික හා සාමාජීය සංවර්ධනය වැඩි දියුණු වන පරිදි ණය පහසුකම් සැපයීමේදී ගතයුතු අමතර ක්‍රියා මාර්ග සමහරක් මෙම අධ්‍යයනයෙන් යෝජනා කර ඇත. ග්‍රාමීය ප්‍රජාවට පහසුවෙන් ණය ලබාදීම සඳහා ණය සැලැස්ම ප්‍රතිව්‍යුහගත කළ යුතුය. ණය අයදුම්කරුවන් දැනුවත් කිරීම හා දිරිමත් කිරීම පමණක් නොව ග්‍රාමීය අංශයේ බැංකු කටයුතුවලට සම්බන්ධ නිලධාරීන් දිරිමත් කිරීමද අවශ්‍යව පවතී. පසුවිපරම් ක්‍රමය වඩාත් විධිමත් විය යුතුය.